සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| තෙවන වාර පරීක්ෂණය 2018 | 10 ශ්‍රේණිය |
| மூன்றாம் தவணைப் பரீட்சை 2018 | தரம் 10 |
| **Third Term Test 2018** | **Grade 10** |

| | | |
|---|---|---|
| ඉතිහාසය | I | පැය එකයි |
| **History** | **I** | **One hour** |

**නම/ විභාග අංකය : .................................................................. පන්තිය : .......................**

- 1 - 40 දක්වා සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01) අනුරාධපුර යුගයේ රාජකීය කාන්තාවන්ගේ ඇඳුම් පැළඳුම් හා ආභරණ පිළිබඳ තොරතුරු හෙළිවන පුරාවිද්‍යා ස්ථානය වනුයේ,

i) දඹුල්ල ii) සීගිරිය iii) කැලණි විහාරය iv) දෙගල්දොරුව

02) ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනයට උපකාරී වන දකුණු ඉන්දීය ද්‍රවිඩ මූලාශ්‍ර යුගලය වන්නේ,

i) සීලප්පදිකාරම් - මණිමේකලෛයි ii) පදිර්රුප්තු - යාල්පානම් වෛපවමාලෛයි

iii) රාමායණය - මහා භාරතය iv) මණිමේකලෛයි - මහා භාරතය

03) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ බවට සාධක හමුවන පහතරට තෙත් කලාපයට අයත් ලෙනක් පිහිටි ස්ථානය වනුයේ,

i) පතිරාජවෙල ii) පොතාන

iii) පාහියන්ගල iv) බෙල්ලන්බැඳි පැලැස්ස

04) පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණය සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය වනුයේ,

i) ස්ථිරවාසිතාවය ii) ජල කළමනාකරණය

iii) මැටි බඳුන් නිශ්පාදනය iv) යකඩ නිස්සාරණය

05) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගනේකන්ද විහාර සෙල්ලිපියේ 'අවරණ' යනුවෙන් දක්වා ඇත්තේ

i) රළපනාව ii) ඇළ iii) වැව් බැම්ම iv) අමුණ

06) ගම්යෙකුගෙන් වී මල්ලක් ණයට ඉල්ලා ගත් දිළිඳු වැසියෙකු පිළිබඳ කතා පුවතක් සඳහන් කෘතිය වන්නේ,

i) ජාතකට්ඨකතාව ii) සද්ධර්ම රත්නාවලිය iii) සමන්ත පාසාදිකාව iv) රසවාහිනිය

07) තම සෙල්ලිපිවල කාලිංග චක්‍රවර්තී යනුවෙන් තමා හඳුන්වාගෙන ඇති රජතුමා වනුයේ,

i) වසභ ii) මහසෙන් iii) නිශ්ශංකමල්ල iv) කාලිංගමාඝ

08) ලංකා ඉතිහාසයේ පියාගෙන් පුතාට රාජ්‍ය උරුමය හිමි වූ අවස්ථාවක් වන්නේ,

i) දුටුගැමුණු - සද්ධාතිස්ස  ii) වසභ - වංකනාතිකතිස්ස

iii) කාශ්‍යප - මුගලන්  iv) බල්ලාටනාග - වළගම්බා

09) පැරණි නිලධාරි තන්ත්‍රයේ භෝජනශාලා අධිකාරි හැඳින්වූ නාමය වන්නේ,

i) බඩගරික  ii) රූප අදෙක  iii) බතගු  iv) කොතුරුගැනා

10) පහත ප්‍රකාශ සලකා බලන්න.

A - ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය දීම

B - පරිපාලන දිස්ත්‍රික්ක වෙන්කර ඒ ඒ දිස්ත්‍රික්ක පාලනයට ඇමතිවරු පත් කිරීම

ඉහත ප්‍රකාශ හා සම්බන්ධ රජවරුන් යුගලය තෝරන්න.

i) දුටුගැමුණු - වසභ  ii) දේවානම්පියතිස්ස - වසභ

iii) I විජයබාහු - වසභ  iv) දේවානම්පියතිස්ස - දුටුගැමුණු

11) තම අනුග්‍රහයෙන් ඉදි කළ ස්තූපයේ වැඩකටයුතු වලට සහභාගි වූ සියලු දෙනාට වැටුප් ගෙවීමට නියම කළ රජතුමා කවු ද?

i) දේවානම්පියතිස්ස  ii) වළගම්බා  iii) මහසෙන්  iv) දුටුගැමුණු

12)

| | A | | B |
|---|---|---|---|
| 1. | IV කාශ්‍යප | A. | සොත්ථිශාලා |
| 2. | I උපතිස්ස | B. | උපසග්ග රෝගනාස |
| 3. | පණ්ඩුකාභය | C. | උම්මග්ග ජල මාතිකා |
| 4. | වසභ | D. | පසවත්තිනාමශාලා |

ඉහත ප්‍රකාශ ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

i) B A D C  ii) C A D B  iii) B D C A  iv) B A C D

- **පහත වගුවේ සඳහන් A සිට I දක්වා තොරතුරු ඇසුරෙන් 13, 14 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| කර්මාන්තය | සෙල්ලිපි වල හැඳින්වූ නම | සෙල්ලිපිය පිහිටි ස්ථානය |
|---|---|---|
| A. යකඩ | D. තුලාධර | G. මහනුවර වේගිරි දේවාලය |
| B. රන් | E. කබර | H. හම්බන්තොට මණ්ඩගල |
| C. ඇත්දල | F. දටික | I. පොළොන්නරුව මුතුගල්ල |

13) යකඩ කර්මාන්තය සෙල්ලිපි වල හඳුන්වන නම හා එම සෙල්ලිපි පිහිටි ස්ථානය ඇතුලත් අක්ෂර යුගලය වන්නේ,

i) D, H  ii) E, G  iii) E, I  iv) F, G

14) තුලාධාර සුමන යනුවෙන් සෙල්ලිපි වල සඳහන් නාමය හා සම්බන්ධ අක්ෂර තුන සඳහන් වන පිළිතුර තෝරන්න.

i) C, D, I  ii) B, D, H  iii) A, D, I  iv) B, F, G

15) චිත්‍ර ශිල්පීන් පැරණි මූලාශ්‍ර වල හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?

i) කබොජ ii) තතවය iii) ලපන iv) වෝහාර

16) අතීතයේ දී අරාබියත් ලංකාවත් අතර ආගමික සබඳතාවක් ගොඩනැගී තිබූ බවට තොරතුරු සඳහන් කරන අරාබි ලේඛකයා,

i) ඉබ්න් ශහ්රියර් ii) අල්-ඔල්සුරි iii) සුලයිමාන් iv) ඉබන් බතුතා

17) ත්‍රිපිටකය මතකයේ තබාගත් භික්ෂූන් වහන්සේ ලා පැරණි ලේඛනවල හැඳින්වූ නම,

i) සදිවිහරිය ii) අන්තේවාසික iii) වසවසික iv) භාණක

18) දහනය සඳහා ඔක්සිජන් වායුව අවශ්‍ය බව මෙරට වැසියා පූර්ව ඓතිහාසික යුගයේ සිට අවබෝධ කරගෙන තිබූ බවට දැක්විය හැකි හොඳම නිදසුනකි.

i) ගින්දර සොයා ගැනීම ii) මැටි ඔරු සුසානය

iii) මැටි බඳුන් iv) ආහාර පිලිස්සීම

19) දකුණු ආසියාවේ වාරි තාක්ෂණය කෙරෙහි බලපෑ ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණික අංගය වනුයේ,

i) සළපනාව ii) බිසෝකොටුව iii) මොහොල iv) වැව් බැම්ම

20) ක්‍රි.පූ. 2 වන සියවසට අයත් සෙල් ලිපියක අධික යනුවෙන් සඳහන් වන්නේ කුමන් කාර්යයක් හා සම්බන්ධ නිලධාරියෙක් ද?

i) ඇළ මාර්ග ඉදි කිරීම සම්බන්ධව

ii) වැවේ ජල පාලන නිලධාරියා

iii) දෙමළ ජනතාවගේ කටයුතු සොයා බැලීමට පත් කළ නිලධාරියා

iv) ප්‍රාදේශීය පාලකයා

21) අඹන් ගඟ හරස් කොට අමුණක් බඳවා වසභ රජු ඉදි කළ ඇළ මාර්ගය වන්නේ,

i) මිණිපේ ii) රිදී බැඳි ඇළ iii) යෝධ ඇළ iv) ඇළහැර

22) දේශීය වෛද්‍ය ක්‍රමයේ ශල්‍යකර්ම පවා සිදු කළ බවට සාධක ලෙස ශල්‍ය උපකරණ හමුවන ස්ථානයකි,

i) මිහින්තලය ii) අභයගිරිය

iii) ආලාහක පිරිවෙන් සංකීර්ණය iv) සීගිරිය

23) අතීතයේ දී කාලය මැනීම සඳහා භාවිතා කරන ලද කුඩාම ඒකකය

i) තිපීය ii) භවජර ii) මස iv) හෝරාව

24) අචල ජල විද්‍යා මූලධර්මය අනුව නිර්මාණය කොට ඇති දැදිගම ඇත් පහනෙහි තෙල් ගබඩා කොට ඇත්තේ පහනේ කුමන කොටසෙ ද?

i) ඇතාගේ හිස් කබලේ ii) ඇතාගේ උදරයේ

iii) ඇතාගේ හොඬයේ iv) ඇත් ගොව්වාගේ ශරීරයේ

25) රජුට අයත් ඉඩම් වල වගා කිරීම වෙනුවෙන් අයකළ බද්ද වනුයේ,

i) දකපති ii) බොජකපති iii) ගෘහ දණ්ඩ iv) මතරබජිඔක

26) අතීතයේ රජවරුන් සමාජ සාධාරණත්වය රැක ගැනීම සඳහා ගත් ක්‍රියා මාර්ගයකට වඩාත්ම ගැළපෙන නිදසුන වන්නේ

i) මහා විනිශ්චයශාලා පිහිටුවීම
ii) සමාජ ධූරාවලියක් ඇති කිරීම
iii) බදු අය කිරීම
iv) දඩ මුදල් විහාරවලට පරිත්‍යාග කිරීම

27) පහත A හා B තීරු ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| | A | | B |
|---|---|---|---|
| 1. | කරපිංචා | A. | අඹු |
| 2. | තලගුලි | B. | යවාගු |
| 3. | කැඳ | C. | කරඹේබිය |
| 4. | ලුණු කැඳ | D. | තිල සංගුලිකා |

i) B A D C
ii) C A D B
iii) C D B A
iv) C D A B

28) අතීතයේ මවක් ලෙස සමාජයේ ගෞරවාදරයට පත් වූ කාන්තාවක් වනුයේ,

i) ලීලාවතී
ii) අශෝකමාලා
iii) විහාරමහාදේවි
iv) චූල සීවලී

- **පහත A සිට E දක්වා තොරතුරු ඇසුරින් 29, 30 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

A - කාලිංග මාඝ පරාජය කිරීම

B - ඇම්බැක්කේ දේවාලය ඉදි කිරීම

C - කව් සිළුමිණ රචනා කිරීම

D - වන්නි ප්‍රදේශ කෝට්ටේ රාජ්‍යයට ඈඳා ගැනීම

E - ජාතක කතා පොත සිංහලට පරිවර්තනය කිරීම

29) දඹදෙණි යුගයේ සිදුවීම් හා සම්බන්ධ පිළිතුර වනුයේ,

i) A, B
ii) C, E
iii) B, E
iv) A, C

30) IV පරාක්‍රමබාහු සහ VI පරාක්‍රමබාහු රජවරුන්ගේ කාර්යයන් ඇතුළත් පිළිතුරු යුගලය පිළිවෙලින් දැක්වෙනුයේ,

i) E, D
ii) A, D
iii) E, C
iv) B, E

31) පහත සඳහන් ඓතිහාසික සිදුවීම් අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර සඳහන් කරන්න.

1. දළදා වහන්සේ බෙලිගලට වැඩමවීම
2. සිංහල සංගය නම් කැරැල්ල ඇති වීම
3. දළදා සිරිත රචනා කිරීම
4. ඊජිප්තුව සමග දූත සම්බන්ධතා පැවැත්වීම
5. චෙංහෝ සෙන්පතියාගේ පැමිණීම

i) 1, 5, 2, 3, 4
ii) 1, 3, 2, 4, 5
iii) 1, 4, 3, 5, 2
iv) 3, 2, 1, 4, 5

- **පහත A, B, C, D ප්‍රකාශ / පද යුගල අධ්‍යයනය කර 32, 33, 34 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| | |
|---|---|
| A - I විමලධර්මසූරිය<br>කුසුමාසන දේවිය | B - ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ<br>උඩරට ප්‍රභූවරු |
| C - ශ්‍රී විජය රාජසිංහ<br>කීර්ති ශ්‍රී රාජසිංහ | D - II රාජසිංහ<br>ඉංග්‍රීසීන් |

32) පළමුවැන්නේ සාර්ථකත්වයට දෙවැන්නේ බලපෑමක් දැක්වෙන පිළිතුර වන්නේ,

i) B  ii) A  iii) C  iv) D

33) පළමුවැන්න නිසා දෙවැන්නේ බලය වර්ධනය වීම දැක්වෙන පිළිතුර වන්නේ,

i) A  ii) C  iii) D  iv) B

34) පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සම්බන්ධයක් නොමැති පිළිතුර

i) A  ii) B  iii) C  iv) D

35) කතෝලික සභාවේ ඇතැම් දුර්වලතා පිළිබඳ විවේචනය කළ පුද්ගලයන් දෙදෙනෙක් වන්නේ,

i) මාටින් ලූතර් - ඉරාස්මස්  ii) මාටින් ලූතර් - බොකැෂියෝ

iii) ඉරාස්මස් - ඩාන්ටේ  iv) මාටින් ලූතර් - තෝමස් මුවර්

36) පෘථිවිය ගෝලාකාර බවට මතය ඉදිරිපත් කළ නූතන තාරකා විද්‍යාවේ පියා,

i) ගැලීලියෝ ගැලිලි  ii) නිකලස් කොපර්නිකස්

iii) ජොහැන්නස් කෙප්ලර්  iv) පැරසල්සස්

37) පුනරුදය ලංකාව කෙරෙහි බලපෑමට මුල් වූ හේතුව වන්නේ,

i) මුද්‍රණ යන්ත්‍රය නිපදවීම  ii) දේශ ගවේෂණය

iii) බටහිර ජාතීන්ගේ පැමිණීම  iv) මානව වාදය පැතිරීම

38) දන්තුරේ සටනට නායකත්වය දුන් සිංහල රජු

i) II විමලධර්මසූරිය  ii) I රාජසිංහ

iii) I විමලධර්මසූරිය  iv) II රාජසිංහ

39) ක්‍රි.ව. 1505 පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට යාපනයේ පාලකයාව සිටියේ,

i) සංකිලි  ii) විජය කුලකෙයි  iii) වරෝදය  iv) පරරාජසේකරම්

40) බටහිර ජාතීන් ශ්‍රී ලංකාවට පැමිණීම නිසා ශ්‍රී ලංකාවේ සමාජ ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රධාන වෙනස්කමක් වන්නේ,

i) මධ්‍යම පන්තියක් බිහිවීම  ii) බැංකු ක්‍රම ඇතිවීම

iii) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් ලැබීම  iv) කර්මාන්ත බිහිවීම

***